DOI: https://doi.org/10.4038/p.v15i2.21
*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 15-Iss. II, Dec. 2024, 115-125.*

# පොළොන්නරු අවධියේ මෙරට අභ්‍යන්තර වෙළෙඳ නගරවල ක්‍රියාකාරීත්වය සහ විදේශීය වෙළෙඳ ශ්‍රේණිවල භූමිකාව

# [The Operation of the Country's Internal Trading Hubs and the Role of Foreign Trade Guilds During the Polonnaruwa Period]

**M.K.L. Irangani**[1]

**Abstract**

Sri Lanka's economy has historically been anchored in an agricultural system supported by an extensive irrigation network, which has laid the foundation for related economic activities. Despite this agrarian base, Sri Lanka's strategic position along the crucial East-West maritime route, coupled with its wealth of resources conducive to commercial activities, enabled it to effectively integrate into and benefit from international trade networks.This research delves into the dynamics of internal trade in Sri Lanka, with a particular emphasis on the development of trading cities and the establishment of a systematic and efficient network for internal commerce. The study employs thematic and contextual analysis methods to scrutinize a variety of sources, including literary texts and archaeological findings, such as inscriptions and relics, which provide insights into the economic strategies of historical periods.A focal point of the investigation is the era following the liberation from Chola rule, when the rulers of Polonnaruwa opted to involve foreign trading communities in the management of these burgeoning internal trade centers. This study explores the reasons behind this reliance on foreign merchants and the operational dynamics of the internal trading cities under their influence. Findings from the research reveal that the area surrounding Polonnaruwa functioned akin to suburban trading centers, where internal trade thrived with significant contributions from these foreign trading communities. The interactions between local and foreign traders facilitated not only the flow of goods but also the exchange of cultural and technological innovations, which played a crucial role in the economic and social development of the region. This study sheds light on the complexities of historical trade practices in Sri Lanka and their implications for the country's economic history.

**Keywords**: Archaeological Sources, Foreign Trade Guilds, Internal Trade, Polonnaruwa, Sri Lankan Economy

1. Professor, Department of Humanities, Faculty of Social Sciences and Humanities, Rajarata Universituy of Sri Lanka.
E-mail: iranganimkl@yahoo.com https://orcid.org/0009-0004-2357-8582

Received: 3 Octomber 2024, Accepted revised version: 22 Dec. 2024.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

## හැඳින්වීම

ඕනෑම රටක විදේශ වෙළෙඳ කටයුතු කාර්යක්ෂම ව සිදු කිරීමේ දී වරාය නගර පමණක් නොව රට අභ්‍යන්තරයේ පිහිටි වෙළෙඳ නගර ද සැලකිය යුතු භූමිකාවක නිරත වේ. එබැවින් අධ්‍යයනයට හසුවන කාලපරිච්ඡේදයේ විදේශ වෙළෙඳාමේ සැබෑ යථාර්ථය ඉස්මතු කිරීමෙහි ලා අභ්‍යන්තර වාණිජ නගරවල හැසිරීම ද පරීක්ෂාවට ලක්කිරීම අත්‍යවශ්‍ය වෙයි. වෙළෙඳ භාණ්ඩ නිෂ්පාදනය, එක්රැස් කිරීම, ආනයනිත භාණ්ඩ බෙදාහැරීම, ප්‍රවාහනය හා සැපයුම ආදි කටයුතු සිදුවුණු, දිවයින පුරා පිහිටි වාණිජ මධ්‍යස්ථාන එකිනෙකින් බැඳුණු ජාලයක් ලෙස මෙම වෙළෙඳ ප්‍රවාහයට බද්ධ වී සිටියේ ය. දකුණු ඉන්දියාවේ චෝල පාලනය යටතේ නකරම්වල ස්වභාවය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකොට ඇති කෙනත් ආර්. හෝල් පෙන්වා දෙන්නේ, රාජ්‍ය බලය සංකේන්ද්‍රණය වූ පරිපාලන මධ්‍යස්ථාන පිහිටි නගරවලට, දුරබැහැර ව පිහිටි කෘෂිකාර්මික බිම්වල, පූජ්‍යස්ථාන ආශ්‍රිත ව හා වරායන් කේන්ද්‍ර කරගෙන ''නකරම්'' නම් වූ වාණිජ නගර බිහි වූ බව යි (Kenneth, 1980: 51- 104). මෙකී අනාවරණය ශ්‍රී ලංකාවේ පොලොන්නරු කාලපරිච්ඡේදය තුළ ද තත් වූ පරිද්දෙන් ම දැකිය හැකි වේ. දහවැනි සියවස වන විටත් (පශ්චාත් අනුරාධපුර අවධියේ) පූජ්‍යස්ථාන ආශ්‍රිත ව නකරම් පැවති බවට සාක්ෂි බදුළු ටැම් ලිපියෙන් ද අනාවරණය වෙයි (EZ, Vol.III, 1993: 78-89). ඊට අනුව හෝපිටිගමු පදිය පිහිටියේ ප්‍රසිද්ධ 'මියුගුණ වෙහෙර හෙවත් මහියංගන විහාරය' ආසන්න ප්‍රදේශයක යි.

අනුරාධපුර පශ්චාත් අවධියේ සිට මෙරට ප්‍රධාන පරිපාලන නගරයේ පිහිටි වෙළෙඳ මධ්‍යස්ථානයට අමතර ව දුරබැහැර ප්‍රදේශවල ඉතා ම කාර්යක්ෂම හා සංවිධිත වාණිජ නගර රජුගේ සෘජු අධීක්ෂණයෙන් පැවති බවට උක්ත සෙල්ලිපිය සාක්ෂි දරයි. අනෙත් පසින් මහාවංසගත තොරතුරු අනුව ක්‍රි.ව. හයවැනි, සත්වැනි සියවස් වන විට මෙරට විශිෂ්ට රාජධානියක් ලෙස අනුරාධපුරය ළඟා වී පැවතියත් අනාගත පරිපාලන මධ්‍යස්ථානයක් වශයෙන් පොලොන්නරුව සංවර්ධනය කරමින් සිටි බව අමතක නොකළ යුතු ය. (මහාවංසය, මහාවංසය, 2004: 44:34, 46:48-74; 49:9-10,18-19ත 50:45-46,85; 54:66; 54:71) එහෙත් හෝපිටිගමු පදිය හැරුණු විට අනුරාධපුර නගරයට තදාසන්න ව පිහිටි වෙනත් ප්‍රධාන වාණිජ මධ්‍යස්ථාන ගැන පුරාවිද්‍යාත්මක සාක්ෂි දුලබ වේ. එසේ වුවත් පෙර අවධියට සාපේක්ෂ ව පොලොන්නරු කාලපරිච්ඡේදය සැලකිල්ලට ගැනීමේ දී මෙම අභ්‍යන්තර වාණිජ නගර සම්බන්ධයෙන් පැහැදිලි සංවර්ධනයක් දැකිය හැකි වේ. විදේශ වෙළෙඳාමට දැඩි නැඹුරුවක් පැවති තත් අවධියේ පරිපාලන නගරය ප්‍රධාන අගනගරය වුවත් ඊට අපෝහක ව සම්බන්ධ වූ වාණිජ නගර රැසක් පොලොන්නරුව මධ්‍යස්ථානය වටා පිහිටුවා තිබුණි ගෝකණ්ණ වරායත්, අගනගරය වූ පොලොන්නරුවත් සුසංයෝග ව ගොඩනැගුණු විදේශ වෙළෙඳාමේ පැවැත්ම හා වර්ධනය රඳා පැවැතියේ මෙම අභ්‍යන්තර වාණිජ මධ්‍යස්ථානවල කාර්යක්ෂමතාව මත යි.

## පර්යේෂණ ගැටලුව සහ අරමුණු

චෝල පාලනයෙන් නිදහස ලබාගත් පොලොන්නරු පාලකයෝ ද චෝලයන් මෙන් ම, අඛණ්ඩ ව තව දුරටත් අභයන්තර වෙළෙඳ නගර පරිපාලනයේ දී, විදේශීය වෙළෙඳ ශ්‍රේණීන්ගේ සේවාව ලබාගත්තේ මන්ද? යන්න සහ මෙකී අභ්‍යන්තර වෙළෙඳ නගරවල ක්‍රියාකාරීත්වය කෙබඳු වී ද? යන ගැටලු පාදක කර ගනිමින් මෙම පර්යේෂණය මෙහෙයවුණි. ඒ අනුව අභයන්තර වෙළෙඳ නගරවල පැතිරීම හඳුනා ගනිමින් ඒවායෙහි ක්‍රියාකාරීත්වයට විදේශීය වෙළෙඳ ශ්‍රේණීන්ගෙන් සිදු වූ සේවාව ප්‍රමාණය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රමුඛ අරමුණ විය. එයින් ජාත්‍යන්තර වෙළෙඳාම කාර්යක්ෂම ව හා ලාභදායී අන්දමින් පවත්වා ගැනීම

සඳහා දේශීය පාලකයන් ගනු ලැබූ තිරසාර ප්‍රතිපත්ති හඳුනාගැනීමට මෙන් ම පාලකයන් වෙනස්වීම රටේ විදේශ වෙළෙඳාමේ යාන්ත්‍රනයට බලපෑම් නොකිරීමට වගබලා ගැනීම වැනි දියුණු සංකල්ප පිරික්සීමටත් මෙම අධ්‍යයනයෙන් අවකාශ ලැබුණි.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ දී සෙල්ලිපි සහ පුරාවිද්‍යාත්මක නශ්ටාවශේෂ කේන්ද්‍රීය ව වෙළෙඳ නගරයන්ගේ පිහිටීම සහ ව්‍යාප්තිය හඳුනාගන්නා අතර වෙළෙඳ නගරයන්ගේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනයේ දී සෙල්ලිපි මූලාශ්‍රයත්, ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රයත් ආධාරයෙන් ඒ ආශ්‍රිත දත්ත එක්රැස් කරයි. එසේ ම අවශ්‍ය පැහැදිලිකිරීම්වල දී සහ තහවුරු කිරීම්වල දී ද්විතීයික මූලාශ්‍රය ද භාවිත කරන ලදි. දත්ත විශ්ලේෂණයේ දී තේමා විශ්ලේෂණ ක්‍රමවේදය සහ සන්දර්භ විශ්ලේෂණ ක්‍රමවේදය (Thematic analysis method and contextual analysis method) ඔස්සේ පර්යේෂණය මෙහෙයවනු ලබයි.

**ප්‍රතිඵල සහ සාකච්ඡාව**

සියවස් දෙක හමාරකට ආසන්න කාලයක දී විශිෂ්ට සංවර්ධනයක් ළඟා කරගත් අගනගරයක් වන පොලොන්නරුව ශ්‍රී ලාංකේය ඉතිහාසයේ සුවිශේෂී කාලපරිච්ඡේදයක් නියෝජනය කරයි. මෙම අවධියේ ඉතිහාසය ගොඩනැඟීමේ දී වංසකථා ප්‍රමුඛ සාහිත්‍යයික මූලාශ්‍රය මඟින් මහත් ආලෝකයක් පතිත කර ඇතත්, පොදුවේ ශ්‍රී ලාංකේය ඓතිහාසික සම්ප්‍රදාය තුළ දැකිය හැකි බෞද්ධ කේන්ද්‍රීය දෘෂ්ටිය නිසා ආර්ථික හා දේශපාලනික ඉතිහාසය ඉස්මතු කර ගැනීමේ දී සීමාකම් දැකිය හැකි වේ. විශේෂයෙන් තත් අවධියේ ආර්ථික ඉතිහාසය ගොඩනැඟීමේ දී වංසකථාවලින් හඳුනාගත නොහැකි තොරතුරු සමුදායක් ශිලාලේඛන මඟින් ලබාගැනීමේ හැකියාව ඇත.

මෙම වාණිජ මධ්‍යස්ථානවල පිහිටීම සැලකිල්ලට ගැනීමේ දී අගනගරය නාභිගත කරමින් ඒ වටා විහිදුණු නගර ජාලයක් රට අභ්‍යන්තරයේ පැවති බව ශිලාලේඛන මඟින් අනාවරණය වෙයි. ඒවා ඉදිකිරීමේ දී රට අභ්‍යන්තරයේ ඇති වාණිජ සම්පත් ඒකරාශී කරගත හැකි ලෙස සම්පත් සංකේන්ද්‍රතාවය සැලකිල්ලට ගෙන, මලය රටට විශේෂ අවධානයක් යොමු කරමින් මෙම කටයුත්ත සිදුකර ඇති බව එමඟින් පෙනේ. අගනගරය පොලොන්නරුවේ පිහිටවීමේ වැදගත්කම එනම්, රට අභ්‍යන්තරයේ පිහිටි වාණිජ නගරවල මෙහෙයුම් මධ්‍යස්ථානය ලෙස ක්‍රියා කිරීමේ හැකියාව හඳුනාගත හැකි ය. එබැවින් තත් අවධියේ පොලොන්නරු අගනගරයේ පැවැත්මෙහි ලා කන්තලේ, වාහල්කඩ, පදවිය, අනුරාධපුර, සීගිරිය, දඹුල්ල, මාගල, කුරුණෑගල, දඹදෙණිය සහ මාතලේ ආදි අභ්‍යන්තර වාණිජ නගර රාශියක් චක්‍රීය ජාලයක් සේ සම්බන්ධ ව සිටි බව සෙල්ලිපි සාධක තහවුරු වෙයි. මෙම නගර අභ්‍යන්තර හා විදේශ වෙළෙඳාමට ඍජු ව ම මැදිහත් වූවා සේ ම එකී වාණිජ නගරවල ව්‍යාප්තියෙන් ලබාදෙන දර්ශක ඔස්සේ තත් අවධියේ ආර්ථික සංවර්ධනය හා නාගරීකරණයේ වර්ධනය ද පිළිබිඹුවෙයි.

භාණ්ඩ නිෂ්පාදනය, එක්රැස් කිරීම හා බෙදාහැරීම යන ප්‍රධාන අරමුණු වටා ඉදිවුණු මෙම වෙළෙඳ නගර විදේශ වෙළෙඳ ශ්‍රේණිවල ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ අතර ඒවාට අවශ්‍ය ස්වාධීනත්වය ලබාදීම නිසා වෙළෙඳුන්ගේ සිත් සතුටු කර එය රටේ ආර්ථික වෘද්ධියට උචිත ලෙස නිදහස් ව ක්‍රියාත්මක වීමට ඉඩ සලස්වා ඇත. වෙළෙඳපොළ හැසිරවීමේ මෙකී රාජ්‍ය ප්‍රතිපත්තිය දියුණු ආර්ථික න්‍යායක තත්වයක් පෙන්නුම් කරන්නකි. වාණිජ නගරවල කිසියම් බලාධිකාරයක් රාජ්‍ය පාලකයා සතු වුවත් එහි කටයුතු බාධාවකින් තොර ව සිදු කර ගැනීමට ඉඩ සලසා තිබීම නිසා වෙළෙඳ ප්‍රජාවට ස්වාධීන ව හා තරඟකාරී ව වෙළෙඳාම හැසිරවීමට හැකියාව ලැබී ඇත.

**අභ්‍යන්තර වෙළෙඳ නගර පරිපාලනයේ දී වෙළෙඳ ශ්‍රේණීන්ගේ භූමිකාව**

**අ). නානාදේශීන් විසින් මෙහෙය වූ වාහල්කඩ පදිය**

මෙරට තත් අවධියේ ක්‍රියාත්මක වූ වෙළෙඳ නගරයන්හි බහුල ව දැකිය හැකි වූ වෙළෙඳ ශ්‍රේණිය වූයේ නානාදේශීන් ය. නානාදේශී (Nana-desi) යනු විවිධ ප්‍රදේශවලින් නැතිනම් විවිධ රටවලවලින් පැමිණි වෙළෙඳුන්ගේ පුළුල් සන්ධානයකි. දකුණුදිග ආසියාවේ මධ්‍යකාලීන රාජ්‍යයන්හි වාණිජ ප්‍රජාවන් අතර ඉතා කීර්තිමත් වූ නානාදේශීන් විසින් පිහිට වූ වාණිජ නගර 'නගරම්' ලෙස හැඳින්වේ (Pathmanadan, 1984: 122). කලාපීය සහ අන්තර් කලාපීය වෙළෙඳාමේ යෙදී සිටින වෙළෙඳුන් නියෝජනය කළ නානාදෙසින් දකුණු ඉන්දියාව සහ අග්නිදිග ආසියාව අතර මෙන් ම ඉන්දියානු උපමහාද්වීපයේ වෙළෙඳ සබඳතා ඇතිකර ගැනීමේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. ඉන්දියාවෙන් පිටත නානාදේශීන් හා ඔවුන්ගේ සහායකයන් පිහිට වූ සෙල්ලිපිවලින් වැඩිම ප්‍රතිශතය හා ඔවුන්ට අයත් පුරාවිද්‍යාත්මක අවශේෂ ශ්‍රී ලංකාවෙන් හමුවීම (Pathmanadan, 1984: 124). ඔවුන් මෙරට තත් අවධියේ බහුල ව ගැවසුණු බවට සාක්ෂියකි. ඔවුන් ඉතා බලවත්, දේශපාලන ගැති බවකින් තොර ස්වාධීන වෙළෙඳ කණ්ඩායමක් බව කියවේ.(Pathmanadan, 1984: 123). ජාත්‍යන්තර වෙළෙඳාමේ නියුතු ප්‍රසිද්ධ වෙළෙඳ ශ්‍රේණියක් පිළිබඳ (සිය මව්රටේ හැරුණු විට) ඉහළ ප්‍රතිශතයක පුරාවිද්‍යා වාර්තා හමුවීම තත් අවධියේ සාගර වෙළෙඳාම ශ්‍රී ලංකාව ලබා තිබූ ප්‍රමුඛතාව විදහා පාන්නකි.

ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ දී හමුවන නානාදේශීන්වරුන්ගේ සෙල්ලිපිවලට අනුව, පට්ටිනම් (වෙළෙඳ නගර) දහ අටක්, වේලපුරම් (මුහුදුබඩ නගර) තිස් දෙකක් හා කටිකයක් තවලම් (වාරික සල්පිල්) හැට හතරක් පිළිබඳ තොරතුරු එස්. පද්මනාදන් පෙන්වා දී ඇත. (පද්මනාදන්, 2000: 567) එබැවින් මෙම ත්‍රිවිධ ආකාර වූ වාණිජ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ ද ඔවුන් සතුව තිබී ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශවල පැවති වාරික සල්පිල් පිළිබඳ ව දහවැනි සියවසේ රචිත රසවාහිනියේත් ගම්පොළ අවධියේ රචිත සද්ධර්මාලංකාරයේත් බොහෝ නිදසුන් හමු වේ. බොහෝ විට නගරම් පිහිටි පොලොන්නරුවට තදාසන්න ප්‍රදේශවලින් බෙහෙවින් දුරබැහැර වූ ප්‍රදේශවල මෙවැනි වාරික සල්පිල් හෙවත් තවලම් වෙළෙඳසැල් ක්‍රමය භාවිතයේ තිබෙන්නට ඇත. අනුරාධපුරය, පොලොන්නරුව, (වේලක්කාර සෙල්ලිපිය, ආනවුලන්දාව, උතුරු වාසල හා රන්කොත් වෙහෙර අතර මැද වූ ශිව දේවාල සෙල් ලිපිය) වාහල්කඩ, පදවිය, විහාරහින්න, ගල්ටැම්පිටිය, කුරුණෑගල බුදුමුත්තාව, මාගල, හම්බන්තොට, දඹුල්ල, ගලේවෙල, අනුරාධපුර ආදි ස්ථානවල නානාදේශීන් සතු නකරම් පැවති බව එස්. පද්මනාදන් පෙන්වා දී ඇත. (පද්මනාදන්, 2000: 570-586) මෙනිසා තත් අවධියේ මෙරට සිටි වෙළෙඳ ශ්‍රේණීන් අතුරින් ඔවුනට ප්‍රධානත්වයක් හිමි ව ඇති බව සනාථ වේ.

උක්ත ප්‍රදේශවලින් ලැබෙන සෙල්ලිපි හා පුරාවිද්‍යා අවශේෂ අනුව මෙරට අභ්‍යන්තර වෙළෙඳ නගරවල සන්දර්භය, ස්වභාවය, ක්‍රියාකාරීත්වය, ඒවායෙහි සංවර්ධනය, ස්වාධීනත්වය හා අපචාර ආදි අංශ රැසක් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි වී තිබේ (Veluppillai, 1972: 7-8). බහුවිධ තොරතුරු ලබාගත හැකි කදිම උදාහරණයක් ලෙස කේ. ඉන්ද්‍රපාල පෙන්වා දී ඇති වාහල්කඩ පිහිටි 'කන්තනේරි' නකරම හෙවත් නානාතේචිය (නානාදේශීය) වීරපට්ටිනම හැඳින්විය හැකි ය (Pathmanandan, 1984: 127). ලිපිය පිහිටවීමේ අරමුණ වී ඇත්තේ, මෙම නකරමෙන් 'කුට්ටිපෙරුමාන්' නැමැත්තෙකුට ගෙවිය යුතු වන්දියක් හේතුවෙන් නගරය අස්ථාවර වීම පිළිබඳ කරන ලද ආයාචනයක් අනුව පාලක සභාව නගරය යළි පිහිටුවීමේ කටයුත්තක් සම්බන්ධ ප්‍රවෘත්තියක් දැක්වීම යි. මෙහි සඳහන් ප්‍රධාන

පුවතට අමතර ව නගරයක ක්‍රියාකාරීත්වය පිළිබඳ කරුණු රැසක් එම ලිපියෙන් අනාවරණය වීම මෙහි දී වැදගත් වේ. එහි 'පට්ටනම' යනුවෙන් හැඳින්වූ පුද්ගලයන් 19 දෙනෙකුගේ නම් හා තනතුරු ඇතුළත් සඳහනක් වේ. සාමාන්‍යයෙන් පට්ටනම යන්න පටුණු නොඑසේනම් වරාය නගර යන්නට යෙදුවත්, පද්මනාදන් 'පට්ටනම' යනුවෙන් යෙදී ඇත්තේ නගරය පරිපාලනය කළ 'පාලක සභාව' යන්නට බව පෙන්වාදෙයි (පද්මනාදන්, 2000: 573). ඒ අනුව මෙම නගර ඉතාම සැලසුම් සහගත ක්‍රමවේදයක් ඔස්සේ ක්‍රියාත්මකව ඇතිබව පෙනී යයි. එවැනි පට්ටනමක් වෙළෙඳුන්, රණකාමීන් හෙවත් ආරක්ෂකයන් හා පරිපාලකයන් යන කොටස් තුනකින් සමන්විත විය.(පද්මනාදන්, 2000: 573). තවද මෙම ලිපියෙහි තනතුරු හා පුද්ගල නාම දක්වෙන සඳහන් ද නගරයක පරිපාලනය හා එහි සැකැස්ම හඳුනාගැනීමට ඉතාමත් වැදගත් වේ. උදාහරණ ලෙස ඉලංචින්කන් නමැත්තා දරන ලද අක්කචාලයි වික්කිරමාතිත්තන් යන තනතුරු නාමයේ මුල්පදයෙන් කාසි සාදන තැනක්, ශිල්පීන්ගේ නිෂ්පාදනාගාරයක්, ශිල්පීය වාසස්ථාන ප්‍රදේශයක් අර්ථවත් වන බවත්, එබැවින් වික්කිරමාතිත්තන් වාහල්කඩ ප්‍රදේශයේ වෙළෙඳ ප්‍රජාව සමග සබඳතා පැවැත්වූ නිෂ්පාදනායතන අධීක්ෂකයෙකු වීමට ඉඩ ඇති බවත් ඔහු නගර සීමාවෙහි ලෝහ භාණ්ඩ නිෂ්පාදන සම්බන්ධීකරණ හා අධීක්ෂණ කටයුතු සිදුකළ නගර නියෝජිතයෙකු විය හැකි බවත් පද්මනාදන් අනාවරණය කර ඇත (පද්මනාදන්, 2000: 573). එනිසා මෙම අනාවරණය නානාදේශීන් ගැන මෙන් ම වාණිජ නගර පරිපාලනය පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමට අතිශයින් වැදගත් වේ.

ඒ අනුව මෙම ප්‍රදේශය ලෝහ භාණ්ඩ නිෂ්පාදන ආයතන පැවති ඒවායේ තත්වයන් අධීක්ෂණයට නියම වූ නිලධාරීන් සිටි කාර්මික නගරයක් බව පැහැදිලි වේ. ලිපියේ එන තවත් තනතුරක් වන්නේ කන්ටන් ජයන්කොන්ටන් විසින් දරූ ''මට්කයියණ්ටාන්'' නම් තනතුර යි. මෙයින් වීරපට්ටනමේ සීමාවේ නියම පරිපාලන වැඩපිළිවෙළක් සහිත රේගු පොළක් පවත්වාගෙන ගිය බවක් අදහස් කෙරෙන බැවින් (පද්මනාදන්, 2000: 574) නගරයක් තුළ රේගු නිලධාරීන් ද සිටි බව සනාථ වෙයි. ඔවුන් භාණ්ඩ හා පුද්ගලයන් පරීක්ෂාව, නගරයට ඇතුළුවන ගැල් පරීක්ෂාව, බදු එකතු කිරීම, දඩ ගැසීම, රේගු වැරදි විමර්ශනය වැනි කටයුතු සිදු කරමින් වාණිජ නගර පරිපාලනයට සහයෝගය ලබා දෙන්නට ඇතැයි සිතිය හැකි ය.

මෙහි සඳහන් 'චික්කන් ඉලපියානයි' නමැත්තා 'වීතිරාචන්' නම් තනතුරක් දරා ඇත. එහි එන වචනාර්ථය අනුව වීදිවල රජු, ප්‍රධානියා, වීථි සම්බන්ධ (ආරක්ෂාව, පවිත්‍රතාව වැනි සේවා) වැඩ කටයුතු සංවිධානය හා අධීක්ෂණ කිරීමේ නිලධාරියෙකු බව හැඟවේ (පද්මනාදන්, 2000: 574). තව ද මෙම ලිපියෙන් අනාවරණය වන පරිදි එම නගරය සතුව කොංකවාලර් හා අංකක්කරාර්වරු වැනි ප්‍රධාන හමුදාවන් ද සෙන්පතිවරුද සිටි බැවින් (පද්මනාදන්, 2000: 574) මනා ආරක්ෂාවක් පැවති, පරිපාලනය කාර්යක්ෂම ව සිදුවුණු, නිෂ්පාදන ආයතන හා රේගු පැවති පරිපූර්ණ නගරයක් බව හෙළි වෙයි. මේවා වාණිජ ප්‍රජාවන් විසින් පාලනය කළද, රජුගේ නියෝග යටතේ පැවතුණා මිස ස්වාධීන ඒකක වීමට ඉඩක් නොමැති බව සිරිවීරයන් පෙන්වා දී තිබේ (සිරිවීර, 2000: 598) දහවැනි සියවසට අයත් බදුලු සෙල්ලිපියට අනුවද වණිග්‍රාමම් ලෙස හැඳින්වූ ශ්‍රේණීන්ගේ කටයුතු නිසැකයෙන් ම රජු විසින් පාලනය කළ බව හෙළිවන හෙයින් (EZ, Vol.III, 1933, 78-82). පොලොන්නරු සමයේ ද මේ තත්ත්වය එලෙසම පවතින්නට ඇතැයි සිතීම සාධාරණ වේ.

මෙසේ සශ්‍රීක වාණිජ ක්‍රියාවලියක් පැවති මෙම නගරයේ ස්වාධීනත්වයට බාධා කරමින් එහි වත්කම් අනිසි ලෙස ලබාගත් 'කුට්ටි පෙරුමාන්' නමැත්තාගේ හැසිරීම නගරයේ

වෙළෙඳ ප්‍රජාවගේ අප්‍රසාදයට හා එහි පරිහානියට බලපා ඇත. මෙහි සඳහන් සිද්ධිය සිදු වූ කාලය පළමුවැනි විජයබාහු රජුට පසු ව ඇති වූ දේශපාලන අස්ථාවරත්වය නිසා සිදු වූ බව එස්. පද්මනාදන් විස්තරාත්මක ව පෙන්වා දී ඇත (Pathmanandan, 1984: 131- 132). ශක්තිමත් පාලන කාලවල සශ්‍රීක වෙළෙඳ නගර ලෙස මෙම නගර ක්‍රියාත්මක වුවත් අරාජික හා බලය සඳහා අරගල පැවති කාලවකවානුවල මෙවැනි නගරවලට ද විවිධ අක්‍රමිකතා, අයුතු බලපෑම් සිදු වූ බවත් එය එහි ස්වාධීන හා ක්‍රමික පාලනයට අහිතකර ඵලවිපාක එක් කළ බවත් උක්ත සෙල්ලිපි සාධකයෙන් මනාව පැහැදිලි වේ.

### ආ). නානාදේශීන් හා වීරවලංචියර්වරුන් විසින් මෙහෙය වූ නකරම්

එමෙන් ම නානාදේශීන්ගේ නකරම් පිළිබඳ ව ඇති සඳහන්වලින් ගම්මිරිස්, ඉඟුරු හා කහ ආදි කුළුබඩුවලින් පිරි පැවති මලය දේශයෙහි කඳු පාමුල පිහිටි දඹුල්ලේ නකරමත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ බුදුමුත්තෑවේ 'වික්කරම චලාමේකපුරම්' (මාගල) නකරමත් බෙහෙවින් වැදගත් වේ. ඉන් දඹුල්ලේ ගලේවෙල දෙමළ පුවරු ලිපියෙන් හෙලිවන පරිදි ''තන්මචාගරජ පට්ටිනම්' හෙවත් 'මහාසේන කාමම්'' නම් නකරමක් ගැනත් නානාතේචීන් හා වීරවලංචියර්වරුන් ගැනත් සඳහන් වන අතර එම වෙළෙඳ ප්‍රජාවන් දෙක එක්ව විහාරයන්හි නකරම පිහිට වූ බව අනුමාන කෙරේ (පද්මනාදන්, 2000: 576-577). එහිද ආරක්ෂක අංශයක් ද සිටි බව හඳුනාගත හැකි ය.

එමෙන් ම බදුමුත්තෑව සෙල්ලිපි සාක්ෂි අනුව මාගල එකොළොස්වැනි, දොළොස්වැනි සියවස්වල දී සංවර්ධිත නගරයක් ලෙස පැවති බව හෙළි වේ. මුල් කාලවල සිට විවිධ පාලකයන්ගේ අවධානය දිනාගත් මෙම ප්‍රදේශය පොලොන්නරු අවධියේ දී වඩා කාර්යක්ෂම හා තරඟකාරී දියුණු වාණිජ නගරයක් වන්නේ බවට පත්වෙමින් තිබුණි. මෙසේ මාගල වාණිජමය නැඹුරුවක් සහිත නාගරික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය වීමෙන් පිළිබිඹු දිවයින පුරා විහිදී තිබූ නගර ජාලයක එක් සාක්ෂියකි. සෙල්ලිපිය ප්‍රකාර ව අඤ්ඤූර්රුවර්වරු (නානාදේශීන්) සැලකිය යුතු ආරක්ෂක බල ඇණියක් සහිත ස්ථාවර වෙළෙඳපොළක් මාගල පවත්වාගෙන ගොස් ඇත. මාගල රාජ්‍ය අනුග්‍රහය දිනාගත් බෞද්ධ, හින්දු පූජ්‍යස්ථාන පිහිටි, වාරි ප්‍රතිසංස්කරණ සිදු වූ වැදගත් ප්‍රදේශයක් ලෙස එකොළොස්වැනි, දොළොස්වැනි සියවස් කාලයේ පැවත ඇති බැවින් (පද්මනාදන්, 2000: 578). රජරට ප්‍රදේශයට අමතර ව දක්ෂිණ දේශය ද ප්‍රධාන වාණිජ මධ්‍යස්ථාන කිහිපයක් පැවති විදේශ වෙළෙඳාමට සක්‍රීයව බද්ධ වූ ප්‍රදේශයක් ලෙස පැවති බව මින් පැහැදලි වේ. ලිපියේ සඳහන් තොරතුරු අනුව මාගල ප්‍රදේශයේ කම්මල්කරුවන් (කම්මාළර්) සහ රජක (වණ්ණාර්) කුල යන දෙපිරිසේ ආරවුලක් කියැවෙන බැවින් (පද්මනාදන්, 2000: 580). එම ප්‍රදේශය ලෝහ භාණ්ඩ නිෂ්පාදන ශිල්ප ශ්‍රේණීන් සිටි කාර්මික ප්‍රදේශයක් බවත් ඔවුන්ගේ නිපැයුම්වලින් දෙස් විදෙස් වෙළෙඳාමට දායකත්වය ලබා දුන් බවත් සිතිය හැකි ය. දක්ෂිණ දේශයේ පිහිටි වෙළෙඳ පොළවල් අතුරින් මාගල හැරුණු විට ගල්ටැම්පිටිය, අත්තරගල්ල හා දෙටියමුල්ල යන ස්ථානවල නානාදේශීන්ට අයත් වෙළෙඳසැල් තිබූ බව හෙළි වුවත් ඒවායෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳ පුළුල් තොරතුරු හමු නො වේ.

### ඇ). අයියම්පොළී පට්ටිනම් හෙවත් පදවිය වෙළෙඳ නගරය

පොලොන්නරු අවධියේ මෙරට පැවති තවත් වැදගත් වෙළෙඳ නගරයක් වූයේ පදවිය යි. එය අයියම්පොළී පට්ටිනම් ලෙස හැඳින්වීය (Veluppillai, 1972: 19–22). පදවිය ශිව දේවාල භූමියේ තිබී හමු වූ කැඩීගිය ලිපි කැබලිවලින් ලැබෙන අසම්පූර්ණ තොරතුරු අනුව එම නගරය වෙළෙඳුන් හා රණශූරයන් සිටි ස්ථානයක් බව හෙළි වේ (Pathmanaden, 1984: 133).

නගරයක පරිපාලනය පිළිබඳ මෙහි දී හමු වූ දෙවැනි සෙල්ලිපියෙන් වැදගත් කරුණු අනාවරණය වේ. කාලානුරූපී ව සංවිධානය කළ වෙළෙඳසැල් හෝ තවලම් පිළිබඳවත්, එකී තවලම සංවිධානය කරන ලද්දේ අයියම්පොලී (Ayyampolil) පට්ටිනම විසින් බවත් එහි කියැවේ (Pathmanaden, 1984: 134). එය වික්කරම කටිකයිට් තවලම් (Vikkirama Katikait tavalam) නමින් හැඳින්වුණු අතර එහි වෙළෙඳ කටයුතු සංවිධානය හා පහසුකම් සැපයීම වෙනුවෙන් නකරම විසින් එහි වෙළෙඳුන්ගෙන් බදු මුදල් සහ රේන්ද බදු අය කර තිබුණි (Pathmanaden, 1984: 134). මෙම සඳහනින් හෙළිදරව් වන විශේෂ තොරතුරක් වන්නේ මෙම වෙළෙඳ නගර කාලානුරූපී ඉල්ලුම වැඩිවීම අනුව තම සැපයුම් පාරිභෝගික ආකර්ෂණයට උචිත පරිද්දෙන් පුළුල් කළ බව යි. තවලම් යනුවෙන් හැඳින්වූයේ එවැනි කාලානුරූපී ව වැඩිවන ඉල්ලුම සැපයීමට සකස්කළ වෙළෙඳ ක්‍රමයකි. එය එක් තැනක හෝ සංචාරක ගැල් ක්‍රමයකින් සිදුවන්නට ඇත. එසේ ම එම ආයෝජන හා පහසුකම් සැපයීම වෙනුවෙන් බදු ලබාගෙන ඇති අතර එකී ආදායම් අනෙක් පසින් රාජ්‍ය ආදායම් වැඩි කිරීමට ද හේතු වූ බව නිසැක ය.

මෙසේ අභ්‍යන්තර වෙළෙඳ ජාලය පුළුල්වීම සහ සක්‍රීය ව පවත්වාගෙන යාම ඍජු ව ම විදේශ වෙළෙඳාමේ වර්ධනයට හේතුවෙන අතර ම අනෙක් අතින් මහජනයාට සිය නිෂ්පාදන සඳහා නිසි වෙළෙඳපොළක් මෙන්ම තෘප්තිමත් ජන ජීවිතයක් සඳහා පහසුකම් සැපයීමක් ද වේ. තව ද මෙම පදවිය නගරය ක්‍රි.ව. එකොළොස්වැනි සියවසේ මුල් භාගයේ ආරම්භ වී ඇති බව පද්මනාදන් පෙන්වාදීම (Pathmanaden, 1984: 134) මඟින් පොළොන්නරු අවධියේ මෙවැනි අභ්‍යන්තර වාණිජ නගරවල පැහැදිලි ඉදිරියක් දිවයින තුළ සිදු ව ඇති බව සනාථ කරයි. තව ද මෙම ප්‍රදේශය නානාදේශීන් හා අනෙකුත් වෙළෙඳුන්ගේ ප්‍රදානයක් නිරන්තරයෙන් ලද එයින් හින්දු දේවාල බහුල ව ඉදිවුණු ප්‍රදේශයක් වීමෙන් ද පෙනී යන්නේ, වෙළෙඳුන්ගේ අවධානයට ලක් වූ ජනාකීර්ණ ප්‍රදේශයක් ව පැවති බව යි. එමෙන් ම එම ප්‍රදේශය කෙරෙහි පරාක්‍රමබාහු රජුගේ කාලයේදී අවධානය යොමු වූ බව ''පදීවාපීය'' (පදවිය වැව) ප්‍රතිසංස්කරණය කිරීමෙන් පැහැදිලි වේ (පරණවිතාන, 1972: 529). එම නාමය තුළ ඇති 'පදි' යන්නෙන් වෙළෙඳපොළ යන අරුත් දෙන බැවින් එම වැව වෙළෙඳපොළ පිහිටි ආසන්නයේ තිබෙන්නට ඇතැයි සිතිය හැකි ය.

### ඈ). නානාදේශීන් හා විහාරහින්න පදිය

එසේ ම විහාරහින්න අභිලේඛන සාක්ෂියක් අනුව එම ප්‍රදේශයේ මානකරමක් ඉදිකිරීම සඳහා මුල්ගලක් තැබීමේ පුවතක් වාර්තා කෙරෙන අතර අක්ෂර විද්‍යානුකූල ව මෙය දොළොස්වැනි සියවසේ අගභාගයට දින නියම කෙරේ (Veluppillai, 1971, 55–57). වෙළෙඳ නගරයක ක්‍රියාකාරීත්වය පිළිබඳ ව එයින් ද යම් ආලෝකයක් ලැබේ. ඊට අනුව එම වෙළෙඳපොළේ නානාදේශීන් සමඟ එක් ව දෛනික වැටුපට වාණිජ කටයුතුවල යෙදුණු තවත් පුද්ගලයන් පිරිසක් ගැන කියැවෙන සඳහන මෙහි දී වැදගත් වේ (Veluppillai, 1971, 135). එමෙන් ම ඔවුනට විවිධ පහසුකම්, නිවාස පහසුකම් ආදිය ද වෙළෙඳ ප්‍රජාවේ සාමූහික මුදලකින් සපයා දී ඇත (Veluppillai, 1971, 135). එබැවින් මෙම වෙළෙඳපොළවල් සිය කාර්ය මණ්ඩලයට උපරිම පහසුකම් සපයමින් සශ්‍රීක මට්ටමින් පැවතුණු බවට මේවා කදිම සාක්ෂි වේ.

### ඉ). පඬුවස්නුවර, පොළොන්නරුව හා අනුරාධපුර නානාදේශීන් විසින් මෙහෙය වූ වෙළෙඳ නගර

කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙටියමුල්ල අභිලේඛනය අනුව පඬුවස්නුවර නානාදේශීන්ගේ වෙළෙඳ නගරයක් පැවති බව හඳුනාගත හැකි වී ඇති අතර එහි වෙළෙඳ වීදියක් පිළිබඳ ව තොරතුරක්

කියැවේ (CTI, Part II, 1972: 16-17). පළමුවැනි පරාක්‍රමබාහු රජු පවා දක්ෂිණ දේශයේ අගනුවර ලෙස පඬුවස්නුවර තෝරා ගැනීමත්, එහි පඬා වැව වැනි වාරිකර්මාන්ත ඉදිකිරීමෙන් තත් අවධිය වන විටත් එම ප්‍රදේශය රාජ්‍ය අවධානය දිනාගත් ප්‍රසිද්ධ ප්‍රදේශයක්ව පැවැති බව පෙනී යයි.

මේ හැරුණු විට නානාදේශීන් සතු වාණිජ නගරයන් පොළොන්නරුවේ හා අනුරාධපුරයේ ද පැවති බව එහි වූ සෙල්ලිපි මූලාශ්‍රය අනුව පෙනී යයි. මින් පොලොන්නරුවේ නකරමක් පැවති බව වේලෙයික්කාර සෙල්ලිපියෙන් හා පොලොන්නරුවේ උතුරු වාසල හා රන්කොත් වෙහෙර අතර වූ ශිව දේවාල ලිපියකින් ද සනාථ වී ඇත (Pathmanaden, 1984: 136-138). එහි නානාදේශීන් මෙන් ම වලංචියර් නම් වෙළෙඳ ප්‍රජාව ද සිටි බව පෙනේ. පොලොන්නරුව අගනගරය මෙන් ම තත් අවධියේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය ද වූ හෙයින් සියලු ම වෙළෙඳ ශ්‍රේණි නියෝජිතයන් එහි සිටි බව අනුමාන කළ හැකි වේ. අනුරාධපුරයේ පැවති නකරමක් පිළිබඳ ලීලාවතී රැජිණගේ අනුරාධපුර රුවන්වැලිසෑ පුවරු ලිපියෙන් සනාථ වේ (පද්මනාදන්, 2000: 584). එහි සඳහන් වන්නේ ලීලාවතී රැජිණ විසින් දිළින්දන් උදෙසා ඉදිකළ 'පල-බලවි-මේධාවි' නම් දාන ශාලාවේ ආරක්ෂාව හා පවත්වාගෙන යාම නානාදේශීන් ලබා කරවා ගත් බව යි. ඒ අනුව අවශ්‍ය කුළුබඩු, රැජිණ යාල් සතරක් කුඹුරුද, දාසයන් තිහක් ද, ගව මහීෂයන් එකසිය පණහක් ද ඇතුළත් නිත්‍ය ප්‍රදාන නානාදේශීන් විසින් සිදුකර ඇත. (පද්මනාදන්, 2000: 584) එහි ඔවුන් සතුව රේගුවක් ද තිබී ඇත. මෙම ලිපියේ එන කරුණු විචාරයට ලක්කරන මහාචාර්ය එස්. පද්මනාදන් එහි වූ රේගුව (මඩිගය) පිහිටි ප්‍රදේශයේ පරිපාලනය, නකරමේ අයිතිය ආදි සියල්ල නානාදේශීන් සතු වූ අතර ලීලාවතී රැජිණගේ ප්‍රදානයෙන් නානාදේශීන් එම ප්‍රදේශයේ ලබා තිබූ තත්වය පිළිගැනීමක් හා නීත්‍යානුකූල කිරීමකැයි ද පෙන්වා දී ඇතැත් (පද්මනාදන්, 2000: 585) එය හුදෙක්ම පිළිගැනීම අසීරු වේ. මන්ද රාජ්‍ය නායිකාව විසින් ඉදිකළ දාන ශාලාවක නඩත්තුව පැවරීම හා එය භාරගැනීම යනු රාජ්‍ය අණ ක්‍රියාත්මක කිරීම හා වෙළෙඳ ශ්‍රේණිය එකී අණ පිළිගැනීම මිස, අදාළ ප්‍රදේශයේ පරිපාලන හෝ වෙනත් අයිතියක් නීතිගත කිරීම නො වේ.

තවද උක්ත පෙන්වා දෙන සෑම නකරමක් ම වෙළෙඳ ප්‍රජාවන් හින්දු හෝ බෞද්ධ ආගමික ආයතනයන්ට ප්‍රදාන සිදු කර තිබෙන හෙයින් තත් අවධියේ රාජ්‍ය අධිකාරිය මෙම වෙළෙඳ ශ්‍රේණීන් ලවා ඔවුන් උපයන ලාභවලින් කොටසක් ආගමික හා පොදු, සුභසාධන ආයතන නඩත්තුව සඳහා යෙදවීමට අවශ්‍ය පියවර ගෙන තිබූ බවක් හැඟී යයි. නූතනයේ පවා ඉහළ ආදායම්ලාභීන් බදු සහන උදෙසා මෙවැනි පොදු කාර්යන්ට ආධාර දීමේ නියැළීම මෙම මතවාදය සාධනයෙහි ලා කිසියම් ආලෝකයක් ලබා දෙයි.

''පන්සියය'' යන අර්ථයෙන් හැඳින්වෙන, ප්‍රභූ සහ සුවිශේෂී වෙළඳ සංසදයක් වූ අයින්නුරුවාර්වරු (Ainnurruvar) පිළිබඳ බුදුමුත්තෑව ලිපි 03 කින් හා පොලොන්නරුව ලිපියකින් ද, (Muller, 1988: 60; CTI, Part II. 1972: 7-12; Ibid, 9-12) වීරකෝට්වරු හා වීරමකලම් (වෙළෙඳ ආරක්‍ෂක බලඇණියකි) පිළිබඳ ව බුදුමුත්තෑව, ගල්ටැම්පිටිය, පදවිය, වාහල්කඩ, ඉල්ලකත්ත (හලාවතට ආසන්න)යන ස්ථානවලින් ලද සෙල්ලිපිවලින් ද (EZ, Vol. II, 1928" 242-255, Veluppillai CTI, Vol. I, Part II. 1972: 113-15, Ibid, pp.19-22; ET, Vol. I, part I, No.2; CTI, Vol. I, 53-54; CTI, Part II, 1972:p.7-9) වලංසියාර් සහ වේලයික්කාරවරු පිළිබඳ පොලොන්නරුව වේලයික්කාර සෙල්ලිපිය, වාහල්කඩ සෙල්ලිපිවලින් ද (EZ, Vol. II, 1928, 235-255; CTI, Part I,1971: 54) (වලංසියාර්වරු වේලක්කාරයන්ගේ ප්‍රධානීන්ය), වෙළෙඳුන් ලෙසත් මුදල් ණයට දෙන්නන් ලෙසත් ක්‍රියා

කොට ඇති චෙත්ති හෙවත් චෙට්ටියාර්වරුන් පිළිබඳ ව හඳුනාගත හැකි ය.

ඒ අනුව පොලොන්නරු අවධියේ අභ්‍යන්තර නගරවල ක්‍රියාකාරීත්වය ඉතා කාර්යක්ෂම හා සංවිධිත ක්‍රමවේදයක් ඔස්සේ සිදුව ඇති බවත් එම වෙළෙඳපලවල ප්‍රධාන ක්‍රියාකාරීන් ලෙස නානාදේශීන් ප්‍රමුඛ විදේශීය වෙළෙඳ ශ්‍රේණි ක්‍රියාකළ බවත් උක්ත තොරතුරුවලින් පෙනී යයි. මෙම සෙල්ලිපිවලින් එම වෙළෙඳ නගරවල රාජ්‍යමය හිමිකම පිළිබඳ කිසියම් දැනුමක් ලබා නොදුන්න ද, විශේෂයෙන් පොලොන්නරුවේ සිංහල පාලකයන් සමයේ රාජ්‍ය අධිකාරී බලය නිසැකව එම වෙළෙඳපොළවල් වෙත යොමුකොට තිබූ බව සමකාලීන සෙසු පරිපාලන හා ආර්ථික කරුණු සංසන්දනය කිරීමෙන් පෙනීයයි. මෙහි ලා කදිම නිදසුනක් දහවැනි සියවසට අයත් බදුළු ටැම් ලිපියෙන් පැහැදිලි කරයි. වෙළෙඳුන්ට සිය ස්වාධීනතාව උපරිමයෙන් සපයා වාණිජ නගර නිදහස්ව සංවර්ධනය කිරීමට ඉඩ ලබා දී තිබුණත් එම නකරම්වලට යටිතල පහසුකම්, ප්‍රවාහන, ආරක්ෂාව, භූමිය හා ශ්‍රමය ආදි අංශවලින් මධ්‍ය රජයට සැලකිය යුතු බදු ආදායමක් ඒවායින් වාර්ෂික ව ලබාදෙන්නට ඇති බවට සැකයක් නැත. එස්. පද්මනාදන් පෙන්වා දෙන පරිදි නගරයේ වෙළෙඳාම හා පරිපාලනය වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාර ව නගරයේ තක්සේරු කරන ලද ආදායමෙන් කොටසක් රජයට ගෙවා තිබීම මෙය තහවුරු කරයි (Pathmananthan,1984: 140-141). වඩා දියුණු ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාගත කළ පොලොන්නරු පාලකයන් විදේශ වෙළෙඳුන්ට අනවශ්‍ය මැදිහත්වීමකින් තොර ව එම වෙළෙඳ නගර සංවර්ධනය කිරීමට අවසර දී ඇති බවත් වෙළෙඳුන්, ආරක්ෂකයන් හෝ පරිපාලකයන් එම නිදහස අයුතු සේ යෙදවීමේ දී ඊට ඍජු ව මැදිහත් වී සමතයකට පත් කළ බවත් උක්ත ලිපි අනුව පැහැදිලි වේ. එමෙන් ම රජවරු මේ වාණිජ මධ්‍යස්ථාන භාර වෙළෙඳුන් රටේ සංස්කෘතික අභිවර්ධනයට ද යොමු කරවා තිබීම වැදගත් වේ. එහි ලාභ හඹා යන වෙළෙඳ ප්‍රජාව වුව ද අධ්‍යාත්මික සංවර්ධනයට හුරු කරවීම හා ස්වයං විනය වර්ධනයට යොමු කරවීමක් හඳුනාගත හැකි ය.

**නිගමනය**

එබැවින් තත් අවධියේ වූ මෙම වාණිජ නගරත සම්පත් ඒකරාශී වීමේ ස්වභාවයන් මනාව සැලකිල්ලට ගනිමින් ස්ථානගත කර ඇති බවත් විදේශ වෙළෙඳාමට අවශ්‍ය භාණ්ඩ හා සේවා ඒකරාශී කිරීමේ මධ්‍යස්ථාන ලෙස මෙන්ම ආනයනිත භාණ්ඩ රට අභ්‍යන්තරයට බෙදාහැරීමේ මධ්‍යස්ථාන ලෙසත් මනාව සංවිධිත පරිපාලනයක් යටතේ ක්‍රියාත්මක වුණු බව සනාථ වේ. තවද දේශීය ගොවි ප්‍රජාවගේ නිෂ්පාදනයන්ට තරඟකාරී වෙළෙඳපොළක් නිර්මාණය කර දෙමින් එකී නිෂ්පාදන, අපනයන වෙළෙඳපොළ වෙත යොමුකිරීමට අවකාශ සැලසීම මෙම විදේශීය වෙළෙඳ ශ්‍රේණීන් ගැවසුණු වෙළෙඳපොළවල් නිර්මාණය කිරීමෙන් සිදුකොට ඇති බව පැහැදිලි වේ. තිරසාර වාණිජ ආර්ථිකයක පැවැත්මට මෙකී නිදහස් හා කාර්යක්ෂම නොඑසේනම් රාජ්‍ය මැදිහත්වීම් අවම වූත් දක්ෂ වෙළෙඳ ප්‍රජාවගේ හා කාර්ය මණ්ඩලයක මූලිකත්වයෙන් පවත්වා ගෙනයනු ලබන වාණිජ මධ්‍යස්ථාන තීරක කාර්යභාරයක් සිදු කළ බව නිසැක ය. රජය එවැනි ආර්ථික මධ්‍යස්ථාන පැවති වාණිජ නගරයන්ට යටිතල පහසුකම් සැපයීම්, දේශපාලන ස්ථාවරත්වය පවත්වාගෙන යමින් ආර්ථික වෘද්ධිය සඳහා අවශ්‍ය සාමකාමී පරිසරය සැකසීම මෙන් ම පවතින නීති රාමුවෙන් ඔබ්බෙහි යම් අනීතික කටයුත්තක් සිදුවන්නේ නම් ඒවා වළක්වා ගැනීමට අවශ්‍ය විධි විධාන ක්‍රියාත්මක කිරීම වැනි පරිධියේ සිට මෙහෙයවෙන භූමිකාවන් සිදු කළා විනා අනිසි මැදිහත්වීම් කිසිවිටකත් සිදු නොකළ බව උක්ත විග්‍රහයෙන් තහවුරු වේ. එසේ ම ස්වාධීන පරිපාලනයක් පැවති පමණින් අකටයුතුකම් සිදුකරමින් රටවැසියා පීඩනයට පත් කිරීමට ද මෙම සැකැස්ම තුළ අවකාශ නො වුණි. වෙළෙඳුන්ට අමතර ව ආරක්ෂකයන්, ආර්ථික නිලධාරීන්,

සෙවකයන් ඇතුළු බොහෝ පිරිසක් මෙම කාර්යබහුල නගරවල සාමකාමී හා තරඟකාරී වාණිජ ජාලයට සහසම්බන්ධ ව සිටිමින් තිරසාර ආර්ථික උන්නතියක් උදෙසා කැපවී සිටිබව සනාථ වේ. තවද නවවැනි දසවැනි සියවස්වල සිට වාණිජ නගර පරිපාලනයේ ක්‍රියාත්මක ව පැවති විදේශීය වෙළෙඳ ශ්‍රේණින්ගේ භූමිකාව චෝළ පාලන සමයේ වඩාත් සක්‍රීය වූ අතර අනතුරු ව බලයට පැමිණි සිංහල පාලකයන් ද එයාකාරයෙන් ම පවත්වා ගෙන ගියහ. මින් වඩාත් පැහැදිලි වන්නේ මෙකී විදේශීය වෙළෙඳ ශ්‍රේණින්ගේ වෙළෙඳ නගර මෙහෙයවීමේ හැකියාව ප්‍රශස්ත මට්ටමක පැවති බව මෙන් ම රාජ්‍ය ආර්ථික ප්‍රතිපත්ති වරින් වර බලයට පත්වන රාජ්‍ය නායකයාට මත දේශපාලනීකරණය නොවූ බව යි. නූතන දියුණු රාජ්‍යයන්හි පවතින මෙවැනි ප්‍රතිපත්තිමය කාරණා මධ්‍යතන ලංකාවේ රාජ්‍ය යාන්ත්‍රනයේ පැවති බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය වීම ද නූතන සමාජයට ගත හැකි මහඟු ආදර්ශයකි.

## මූලාශ්‍රය


පද්මනාදන්, එස්. (පරි.) සුමුදු ධර්මරත්න (2004) "*මධ්‍යතන ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ වේලක්කාර භට සේනාවේ කාර්යභාරය*", අනුමෝදනා, මහාචාර්ය අනුරාධ සෙනෙවිරත්න උපහාර ලිපි සංග්‍රහය, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පරණවිතාන ඇස්., (1972) "*පොලොන්නරු යුගයේ සභ්‍යත්වය*", ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, II භාගය. කැලණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

*මහාවංස*, (2004) සංස්. සුමංගල හිමි, එච්. බටුවන්තුඩාවේ සහ නන්දදේව විජේසේකර, කොළඹ: බෞද්ධ කටයුතු මධ්‍යස්ථානය.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති, (2001) *රජරට ශිෂ්ටාචාරය හා නිරිත දිග රාජධානී*, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

*Ancient Inscription in Ceylon*, (1988) Muller, London:

*Ceylon Tamil Inscription*, Part, I, (1971) A.Velupillei, Peradeniya.

*Ceylon Tamil Inscriptions*, Part, II, (1972) A.Velappillai, Peradeniya.

Collapse of the Rajarata Civilization and Drift to the South-West, Peradeniya:

Department Centenary (1890-1990) Commemorative Series, Section IV.

*Epigraphia Zeylanica*, Vol.I, (1912) ed.D.M.D.Z.Wikramasingha, London: Oxford University Press.

*Epigraphia Zeylanica*, Vol.II, (1928) ed.D.M.D.Z.Wikramasingha, London:Oxford University Press.

*Epigraphia Zeylanica*, Vol.III, (1933) ed.S.Paranavitana, London:Oxford University Press.

*Epigraphia Tamilica*, Vol. I, Part I, (1971) K. Indrapala, Jaffna Archaeological Society.

*Epigraphia Tamalica*, Part II, (1972) A.Veluppilalai, Peradeniya.

Gunawardhana, R.A.L.H. (2003) "*Seaways to Sielediba: Changing patterns of navigation in the Indian Ocean and their Impact on Pre-colonial Sri Lankan*", Sri Lanka & the Silk Road at the sea, Colombo: Sri Lanka Institute of International relation.pp.17-35.

Indrapala K., (1963) Ed. "*The Nainative Tamil Inscription of Paralramabahu I*", University of Ceylon Review, Vol.XXI, No.1, University of Ceylon, pp.63-70.

Indrapala, K.(1971) "*Invasions from South India and the Abandonment of Polonnaruwa*",

Indrapala K, (1986) "*The Role of Peninsular India Muslim Trading Communities in the Indian Ocean Trade*," Muslims of the Sri Lanka, M.A.M. Shukri, Beruwala.

"*Inscriptions 800-1200A.D*", Inscriptions, Vol. II, (1990) Dias Malani, Archaeological

Kiribamune, S. (1991-1992) "*The Role of the Port City of Mahathittha (Mantota) in the Trade Networks of the Indian Ocea*n", The Sri Lanka Journal of the Humanities, Nos. 1&2, Vol. xvii & xviii, pp.171-192.

Kiribamune, S. (1987) (1989)"*Trade Pattern in the Indian Ocean & Their Impact on the Politics of Medieval Sri Lanka*" K.W.Gunawardhana Felicitation, Modern Sri Lanka Studies, Vol. II.pp. 67-78.

Pathmanathan S, (1984) "*The Nagaram of the Nanadesis in Sri Lanka, Circa AD. 1000-1300"*, The Sri Lanka Journal of Humanities, Vol. X, No. 1 & 2, Peradeniya: University of Peradeniya, pp.122-163.

Pathmanathan S, (1982) "*The Cities of Medieval Sri Lanka (A.D.1000-1250) Center of Dynastic Power, Religious Authority and Commercial Activity*", Sri Lanka Journal of Social Sciences, Vol. V, No.1, Colombo: Published by The Natural Resources, Energy & Science Authority of Sri Lanka, pp.11-34.

Trincomalee Inscriptions Series, No.1, (1974) S. Gunasingam, Peradeniya.